සියලු ම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
**Second Term Evaluation -2014**

| | | |
|---|---|---|
| 08 ශ්‍රේණිය<br>தரம் 08<br>Grade 08 | සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும் வினாத்தாள் -1<br>Sinhala Language & Literature Paper I | *පැය එකයි*<br>*ஒரு மணித்தியாலம்*<br>*One Hour* |

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- I පත්‍රයට ලකුණු 40 කි.
- තද කළු අකුරින් මුද්‍රිත පදවලට ගැළපෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

01. ලොකු දුව ගිය පසු තමාට **තනිට තනියම** සිටීමට සිදුවන බව අම්මා පැවසුවාය.
    (i) වැඩ කරමින් (ii) හුදෙකලාව (iii) එනතුරු (iv) දුකෙන්

02. පියා මියගිය පසු ඔවුන්ගේ නිවසට **බහින කලාව** උදා විය.
    (i) දියුණුව (ii) ආර්ථික දුෂ්කරතා (iii) ණයට ගැනීම (iv) පිරිහෙන කාලය

- පද දෙකම පූර්ව ක්‍රියා යොදා සකස් කර ගත් යුගල පදයක් ලියන්න.

03. ..........................................................................................

04. අයියා මිදුලේ <u>ඇවිදිමින්</u> සිටින අතරේ තාත්තා අප ලවා අකුරු <u>ලියවයි.</u>

- ඉහත ඉරි ඇඳි පද දෙකේ ක්‍රියා වර්ගය ලියන්න.
    (i) ඇවිදිමින් - ..........................................................
    (ii) ලියවයි - ..........................................................

- කුල්ල, උකුස්සා, ගොවියා යන පදවල නාම ප්‍රකෘතිය තෝරා යටින් ඉරක් අඳින්න.

05. I. කුල්, උකුසු, ගොවි II. කුලු, උකුස්, ගොවි
    III. කුලු, උකුස්සා, ගොවි IV. කුලු, උකුසු, ගොවි

- මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය තෝරා තිත් ඉර මත ලියන්න.

06. I. අළු පුහුල් II. ඥාණවන්ත
    III. සජ්ඣායනා IV. වෙළඹ .....

- පහත දී ඇති ප්‍රකාශ හතර කියවා වැරදි ප්‍රකාශය යටින් ඉරක් අඳින්න.

07. I. 'ළපටි' යන අදහස ඇති වචනවල යෙදෙන්නේ මූර්ධජ 'ළ' යන්නයි.
    II. මූර්ධජ 'ෂ' යන්නට පසු මූර්ධජ 'ණ' යෙදේ.
    III. නාම පදයක ප්‍රකෘතියේ 'ල' කාර දෙකක් ඇති විට බොහෝ අවස්ථාවල මුල් ශබ්දය දන්තජ 'ල' වේ.
    IV. රකාරාංශයට පසුව යෙදෙනුයේ මූර්ධජ 'ණ' යන්නයි.

• පහත වාක්‍යය කියවා හිස් තැන්වලට අදාළ විරාම ලකුණු යොදා සම්පූර්ණ වාක්‍යය නැවත ලියන්න.

08. ළමයින්ට 2 ☐ 3 අනුපාතයට පලතුරු බෙදා මම ගෙදර යමි ☐යි තාත්තා කීවේ ය ☐

..........................................................................................................................................

..........................................................................................................................................

• මුලින් දී ඇති පදයට සමානාර්ථයක් යෙදී නැති වචනය තෝරා තිත් ඉර මත ලියන්න.

09. අකමැත්ත-නොසතුට, අප්‍රසාදය, නොරිසි, නොදමුණු ..........................................

• පහත කවිය කියවා එහි ඇති එක් පදයක් ලියා එයට විරුද්ධ පදය කවියෙන් ම සොයා ලියන්න.

විකසිත මලක් වෙමි දිවි මග සැමදාම
බාධක බිඳින නදියකි මම පෙර සේ ම
මුකුලිත සිහින නොදකිමි දිවි ඇති තුරුම
දින රද කිරණ ගනඳුර බිඳ යයි තව ම

10. ..........................................................................................................................

• පහත වාක්‍යය කියවා එයට ගැළපෙන තනි වචනය යොදන්න.

11. ගසක මැද තිබෙන කද කොටස ..........................................

• වරහන් තුළ ඇති වචන හිස්තැන්වලට සුදුසු පරිදි යොදන්න.

12. රාත්‍රියේ .............................. සඳ බැලූ ගොවිරාල පරිසරය සිසාරා .............................. හැර පායි. (අඬ, අඩ)

13. .............................. පීදුණු කෙසෙල් ගස ඉවත්කොට ඔහු එතැන .............................. මල් ගසක් සිටෙව්වේ ය. (වද, වඳ)

• කවිය කියවා අසා ඇති ප්‍රශ්න දෙකට පිළිතුරු ලියන්න.

තිත්ත කැකිරි ගෙඩි මාමට දීපන්
තෙලං කැකිරි ගෙඩි නැන්දට දීපන්
පුංචි රබානේ ගින්දර දාපන්
ගහන රබන් පද හරියට ගහපන්

14. මෙහි යෙදී ඇති ගුණ නාමයක් ලියන්න ..........................................

15. ක්‍රියා නාමයක් ලියන්න ..........................................

• මුලින් දක්වෙන වචනයට බහු අර්ථයක් නොදෙන පදය තෝරන්න.

16. පස-පහ, පස්, ශක්තිය, පස්ස ..........................................

17. ලෝකයට අයිති යන අදහස දෙන තද්ධිත පදය ලියන්න.

18. දී ඇති ප්‍රස්තාව පිරුළේ මුල් කොටස සම්පූර්ණ කරන්න.

.............................................................................. වලිගය නැති ගොනා වාගෙයි.

• පහත වාක්‍යය කියවා සුදුසු ක්‍රියා පද යොදන්න.

19. පුතුණුවෝ පොත් ..........................................

20. වැසි වැටුණු නිසා පුෂ්ප විකසිත ..........................................

(ලකුණු 40)

## II කොටස

- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- දෙවන පත්‍රය සඳහා මුළු ලකුණු 60 කි.

01. ඔබේ පංතියේ පැවැත් වූ ව්‍යුහගත රචනා ඇගයීම අනුව පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබේ කණ්ඩායමට ලැබුණු රචනා මාතෘකාව නම් කරන්න. (ල. 02)

(ii) ඔබේ ගුරුතුමා හෝ ගුරුතුමිය දුන් උපදෙස් කෙටියෙන් ලියන්න. (ල. 04)

(iii) මෙම ඇගැයීම ක්‍රියාත්මක කිරීමේදී ඔබට ඇති වූ ගැටලු 2 ක් ලියන්න. (ල. 04)

(iv) රචනා ඇගයීමේ දී ඔබට ලකුණු ලබාදුන් නිර්ණායකයක් ලියන්න. (ල. 02)

(v) මෙම ක්‍රියාකාරකමේ දී ඔබ ලබාගත් ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 16)

02. පහත දක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

(i) අප භාවිත කරන වචනවල ඇති වටිනාකම

(ii) සකල ලෝකවාසීන්ගේ ගෞරවයට ලක්වන දළදා වහන්සේ

(iii) බාධාවලට බාධා ගෙන දී පෙරට මැ යමු

(iv) සරු පොළොවක් අපට ඇතේ

(v) උත්සාහයෙන් සුන්දර අනාගතයක් හිමිකර ගනිමු. (ලකුණු 14)

03. පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"රත් නුවන් අහසට බමන්නිය
රත් මලින් සියොලඟ සදන්නිය
රත් දළින් නරයන් බුදින්නිය

නොදන්නෝ කවුරු
කුවේණිය රුදුරු"

(i) කුවේණියගේ අති බියකරු විලාසය කියවෙන ප්‍රකාශය උපුටා දක්වන්න. (ලකුණු 02)

(ii) මෙහි පළමු කවි පාදයේ අර්ථය ලියන්න. (ලකුණු 02)

(iii) රත් මල් ගෙන ඇය කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(iv) 'නුවන්', 'නරයන්', යන්නට සමාන පදය බැගින් ලියන්න. (ලකුණු 02)

(v) මෙම කවිය උපුටාගත් ග්‍රන්ථයේ ලේඛකයා නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

04. පහත සඳහන් ගද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

"කුමක් ද බට යම් කෙනෙකුන් ම ලබවූ දූ"

(i) ඉහත ප්‍රකාශය කිරීමට මුල් වූ කරුණ කුමක්ද? (ලකුණු 02)

(ii) මෙසේ කියන්නේ කවුරුන්ද? (ලකුණු 02)

(iii) මෙසේ කියන්නේ කාහටද? (ලකුණු 02)

(iv) මේ ප්‍රකාශය එන පාඩම අයත් පොත නම් කරන්න. (ලකුණු 02)

(v) 'බට' යන්නෙන් අදහස් වන ස්ථානය නම් කරන්න. (ලකුණු 02)



40

05. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

එකක් සිතා අනෙකක් කීම ඉතාම අප්‍රසාදජනකයි. සත්‍යය ප්‍රකාශ කිරීම මා විශ්වාස කරන ප්‍රධාන ම ගුණාංගයයි. බොරුව කෙතරම් පණ පිහිටුවා කීවත්, එයට ආත්මයහක් නැති බව තහවුරු වීමට වැඩි කාලයක් ගත වන්නේ නැහැ. බොරුව හෙළි වූ විට පළමු ප්‍රහාරය එල්ල වන්නේ විශ්වාසයටයි. දෙමවුපියන් තම දරුවන්ට අතිශය කරුණවක් දක්වතත් ඔවුන්ට යමක් ඒත්තු ගැන්වීමේ දී සමහරුන් අසාර්ථක වෙනවා. සේවා ස්ථානයේ දී සාර්ථක ලෙස කටයුතු කරන සමහර අය තම නිවසේ දී අසාර්ථකයි. මෙසේ සිදු වන්නේ අන්‍යෝන්‍ය ප්‍රකාශන හැකියාවේ අඩුපාඩුකම් නිසයි. මේ නිසා අදහසක් ප්‍රකාශ කිරීමේ හැකියාව බස හැසිරවීමේ දී අත්‍යවශ්‍යයි.

(i) මෙම ඡේදයට අනුව අප කියන බොරු හෙළි වූ විට පළමුවෙන් ම බිඳ වැටෙන්නේ කුමක් ද?

(ii) බස හැසිරවීමේ දී අවශ්‍යයෙන් ම තිබිය යුතු සාධකය කුමක් ද?

(iii) එක් තැනක සාර්ථක වන අය තවත් තැනක අසාර්ථක වන්නේ ඇයි?

(iv) "අදහස් රසවත් ව තහවුරු වන ලෙස බොරු ගොතා කීවද එයට වැඩි කාලයක් නැත" යන්න කියවෙන ප්‍රකාශය උපුටා දක්වන්න.

(v) මෙහි හිස්තැන සම්පූර්ණ කරන්න.
'මා විශ්වාස කරන ප්‍රධාන ම ගුණාංගය .................................. කිරීමයි.

(2 x 5 = 10)

06. රත්මලාන අඹගහපුර සෝමාදේවී විදුහලේ දරුදැරියන්ට ක්‍රීඩා කිරීමට ක්‍රීඩා පිටියක් නැත. තැන් තැන්වල ක්‍රීඩා කරන බැවින් සිදුවන අනතුරු ද බහුල ය. පාසල අසල අතහැර දැමූ අක්කර දෙකක පමණ හිස් ඉඩම පාසලට ලබාදෙන ලෙස ඉල්ලා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය තුමාට ලිපියක් ලියන්න. ලිපිය ලියන ඔබ ක්‍රීඩා සංගමයේ ලේකම් යයි සිතන්න.

(ලකුණු 10)



41